**කොවිඩ් 19 සති පාසල සබරගමුව පළාත**

**9 ශ්‍රේණිය - භූගෝල විද්‍යාව**

**ඒකකය 01- ආසියානු ප්‍රදේශය**

## ක්‍රියාකාරකම 02

ආසියානු ප්‍රදේශයේ සුවිශේෂත්වය

## හැඳින්වීම

ආසියානු ප්‍රදේශය ගත් විට සුවිශේෂී මහද්වීපයක් ලෙස හැඳින්විය හැකිය. භෞතික භූ දර්ශනය මෙන්ම භෞතික භූ දර්ශනය මත සකස් වූ මානුෂ භූ දර්ශනය ගත් විට සුවිශේෂීතා බොහෝමයක් මෙම මහද්වීපය තුළ දැක ගත හැකි වේ.

## ක්‍රියාකාරකම සඳහා උපදෙස්

- පෙළ පොතෙහි පිටු අංක 03-04 හොඳින් කියවා පිළිතුරු සපයන්න.
- පිළිතුරු ලිවීමට පෙර අනිවාර්යෙන්ම ප්‍රශ්නය අභ්‍යාස පොතෙහි සටහන් කර පිළිතුරු ලියන්න.
- අවශ්‍ය අවස්ථාවන්හිදී ලෝක සිතියම් පොත පරිශීලනය කරන්න.
- සිතියම් ලකුණු කිරීමේදී පාට පැන්සල් භාවිතා කරන්න.

## ප්‍රශ්නාවලිය

1. ආසියානු ප්‍රදේශය සුවිශේෂී ප්‍රදේශයක් ලෙස හැඳින්වීමට හේතු තුනක් දක්වන්න.
2. ආසියානු ප්‍රදේශයේ විශාලත්වය කොපමණද?
3. ලොව විශාලම කඳු පන්තිය කුමක්ද?
4. ලොව වඩාත් උසින්ම පිහිටා ඇති එවරස්ට් කඳු ශිඛරයෙහි උස කොපමණද?
5. මුහුදු මට්ටමට වඩා පහතින්ම පිහිටා ඇති ස්ථානය කුමක්ද?
6. ආසියා මහද්වීපය තුළ පිහිටා ඇති ,
    - ලෝකයේ වැඩිම වර්ෂාපතනයක් ලැබෙන ප්‍රදේශය
    - අඩුම වර්ෂාතනපයක් ලැබෙන ප්‍රදේශය නම් කරන්න.
7. සමස්ත ජන සංඛ්‍යාවෙන් කොපමණ ප්‍රමාණයක් ආසියා මහද්වීපය තුළ ජීවත් වේද?
8. ආසියා මහද්වීපය තුළ පිහිටන ලෝකයේ ජන සංඛ්‍යාව වැඩිම රටවල් දෙක නම් කරන්න.

9. ලෝකයේ වඩාත් ජනාධිකම රටවල් 10 ට අයත් වන ආසියා මහද්වීපයේ පිහිටන රටවල් මොනවාද?

10. ආසියාවේ සාමාන්‍ය ජන ගනත්වය කොපමණද?

11. ආසියා මහද්වීපයට අයත් ස්වාධීන රටවල් සංඛ්‍යාව කොපමණද?

12. චීනයේ පමණක් භාවිතා වන භාෂා ප්‍රමාණය කොපමණද?

13. ආසියානු මහද්වීපයේ පිහිටි ලොව ඉපැරණි ශිෂ්ටාචාර 03නම් කරන්න.

14. ආසියානු ප්‍රදේශය නිජබිම වන ලොව ප්‍රධාන ආගම් 04 නම් කරන්න.

15. පහත සඳහන් ස්ථාන ලෝක ආකෘති සිතියමක ලකුණු කර නම් කරන්න.

- හිමාලයා කන්ද
- මල මුහුද
- ගෝබි කාන්තාරය
- ඉන්දියාවේ චෙරාපුංජි
- චීනය , ඉන්දියාව

**පසු වැඩ**

- ආසියාවේ දේශපාලන බෙදීම් සිතියම ඇසුරෙන් ආසියා මහද්වීපයට අයත් රටවල් ලයිස්තු ගත කරන්න.
- ආසියානු මහද්වීපයේ සුවිශේෂත්වය යන මැයෙන් ලිපියක් සකස් කරන්න.

සැකසුම :
කේ.එන්.බී.බී.එම්.ජී.අයි.කේ.නිරිඇල්ල
ර / නිවි / ඇලපාත මහා විද්‍යාලය.